සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2022
## 11 ශ්‍රේණිය සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I කාලය පැය 01 යි.

| නම/ විභාග අංකයෘ |
|---|

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40 ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණක් යොදන්න.

01. කෙනෙකුගේ පංචේන්ද්‍රිය මගින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන තේරුම් ගැනීම හඳුන්වන්නේ,
(1) අර්ථකථනය යි. (2) මාධ්‍ය අභිසාරිතාවය යි.
(3) සංජානනය යි. (4) විකේතකරණය යි.

02. ආත්ම භාෂණයට ප්‍රමුඛත්වයක් දෙමින් සිදුවන සන්නිවේදන වර්ගය වන්නේ,
(1) අන්තර්පුද්ගල සන්නිවේදනය (2) සමූහ සන්නිවේදනය
(3) මහජන සන්නිවේදනය (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

03. ගවේශණාත්මක ප්‍රවෘත්ති කලාව යනු,
(1) බටිටු වාර්තාකරුවන් වැඩි වශයෙන් භාවිත කරන වාර්තාකරණය යි.
(2) නිල පොලිස් මූලාශ්‍ර භාවිත කරමින් සිදු කෙරෙන වාර්තාකරණය යි.
(3) සිදුවීම් වලට සමාන්තරව සිදු කෙරෙන වාර්තාකරණය යි.
(4) සඟවා ඇති තොරතුරු එක් රැස් කර වාර්තාකරණය යි.

04. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් විසින් නිපද වූ දුරකථන මගින් කෙරෙන අදහස් හුවමාරුව පදනම් කර ගනිමින් ගණිතමය ආකෘතියක් ඉදිරිපත් කරනු ලැබුවේ,
(1) ක්ලොයිඩ් ෂැනෝන් හා වොරන් වීවර් (2) විල්බර්ශ්‍රාම් හා ෂැනෝන් වීවර්
(3) කර්ට් ලෙවින් හා විල්බර් ශ්‍රාම් (4) හැරල්ඩ් ඩී. ලැස්වෙල් හා විල්බර් ශ්‍රාම්

05. භාෂාවේ මූලික කාර්යයක් නොවන්නේ,
(1) සැබෑව හඳුනා ගැනීම. (2) දැනුම සංරක්ෂණය.
(3) සිතීම විධිමත් කිරීම. (4) සවන්දීමට පුරුදු වීම.

06. මුද්‍රණ ශිල්පය මෙරටට හඳුන්වා දෙනු ලැබුයේ,
(1) පෘතුගීසීන් විසිනි. (2) ඉංග්‍රීසීන් විසිනි.
(3) ලන්දේසීන් විසිනි. (4) අරාබින් විසිනි.

07. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව කුමන රජයේ පරිත්‍යාගයක් ද?
(1) චීන රජය (2) ඇමරිකානු රජය (3) ජපන් රජය (4) බ්‍රිතාන්‍ය රජය

08. ජනමාධ්‍ය හරහා සම්ප්‍රේෂණය කරනු ලබන පණිවිඩය පිළිබඳ පාලනයක් සිදු කළ හැකි පුද්ගයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් වන්නේ,
(1) නියාමකයෝ (2) දොරටුපාලකයෝ (3) නිසි බලධාරීන් (4) සංස්කාරකවරු

09. පේජරය වර්තමානයේ දී භාවිතයෙන් ගිලිහී යමින් පවතින තොරතුරු හුවමාරු උපකරණයකි. මේ තත්වය ඇතිවීමට බලපෑ හේතුව වන්නේ,
(1) එය මිල අධික උපකරණයක් වීමයි. (2) ජංගම දුරකතනය ව්‍යාප්ත වීමයි.
(3) අන්තර්ජාලය ව්‍යාප්ත වීමයි. (4) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර භාවිතය.

10. බ්‍රෝඩ්ෂීට් පුවත්පතක ලක්ෂණයක් නොවන්නේ,
    (1) පළල් පිටු සහිත පුවත්පත්ය.
    (2) උසස් මට්ටමේ ජනසන්නිවේදන ක්‍රියාකාරකම් වලින් යුක්තය.
    (3) ආකර්ෂණීය හා සරල ආකෘති වලින් යුක්තය.
    (4) ජාතික හා අන්තර්ජාතික තේමාවලින් යුක්තය.
11. මානනය හා අනාවරණය යන අවස්ථා දෙකෙහිම එකම කාචයක් භාවිත වන්නේ,
    (1) ඒක කාච ප්‍රතිෂායා කැමරාව (2) ශ්‍රමායික කැමරාව
    (3) ප්‍රතිශීර්ෂ කැමරාව (4) ස්වයංක්‍රීය කැමරාව
12. පරිගණක අකුරු සැකසීම පිටු සැලසුම් හා ඡායාරූප සංස්කරණය මූලික අවශ්‍යතාවයක් වන්නේ,
    (1) ලෙටර්ප්‍රෙස් මුද්‍රණයේ දී (2) පරිගණක ආශ්‍රිත ප්‍රකාශිත ක්‍රියාවලියේ දී
    (3) ස්ක්‍රීන් මුද්‍රණයේ දී (4) ලිතොග්‍රැපි මුද්‍රණයේ දී
13. ''මානිගෙ තීරුව'' නැමැති පුවත්පත් ලිපිය අයත් වන්නේ,
    (1) කතු වැකියටයි. (2) වෙළඳ දැන්වීමකටයි.
    (3) ප්‍රවෘත්ති ලිපියකටයි. (4) තීරු ලිපියකටයි.
14. ගුවන් විදුලි මාධ්‍යයේ ප්‍රභලතාවයක් වන්නේ,
    (1) ශබ්ද පාදක මාධ්‍යයකි.
    (2) භූගෝලීය බාධක විරල මාධ්‍යයකි.
    (3) එක් වරක් පමණක් ඇසීම.
    (4) අවධානය ඉවතට යොමු වීමේ හැකියාව වැඩි වීමයි.
15. කිසියම් සංදේශයකින් ඉදිරිපත් වන අදහස කුමක් ද යන්න තීරණය වීමට බලපාන සාධකයක් නොවන්නේ,
    (1) මාධ්‍ය ආයතනයේ හිමිකාරීත්වය (2) සංස්කෘතික පසුබිම
    (3) තාක්ෂණික උපකරණ (4) අදාළ කාලය තුළ දේශපාලන තත්වය
16. ක්ෂේත්‍ර ගැඹුර අඩු වැඩි කර ගැනීමෙන් නොයෙක් නිර්මාණ කළ හැකි වේ. ක්ෂේත්‍ර ගැඹුර ඉදිරියට වඩා පසුපසට මදක් වැඩි වී ඇතිවීමේ දී යොදා ගන්නේ,
    (1) ලොකු කාච විවරයයි. (2) මැදි කාච විවරයයි.
    (3) කුඩා කාච විවරයි. (4) උචිත කැමරා කෝණය.
17. ඡායාරූපයක පැහැඅන්තරය යනු,
    (1) උණුසුම් හා සිසිල් වර්ණ අතර අනුපාතය
    (2) නිල් හා රතු වර්ණ අතර අනුපාතය
    (3) ගිනියම් වර්ණ හා දුර්වර්ණ අතර අනුපාතය
    (4) ආලෝකය හා අඳුර අතර අනුපාතය.
18. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ දී අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීමේ දී දැනට වඩාත් ජනප්‍රිය වූ මෘදුකාංගය වන්නේ,
    A - ඇඩෝබ් පේජ්මේකර් B - ඇඩෝබ් ඉන්ඩිසයින්
    C - මයික්‍රෝසොෆ්ට් පබ්ලිෂර් D - කොරල් ඩ්‍රෝ
    මෙම ප්‍රකාශ අතුරින්
    (1) A, B පමණක් නිවැරදිය. (2) B, C, D පමණකි නිවැරදියි
    (3) A, C, D පමණක් නිවැරදිය. (4) A, B, C , D යන සියල්ලම නිවැරදිය.
19. පවුල යනු සමාජ සංයුතියේ කුඩාම ඒකකයි. පවුල වෙත පැවරි ඇති මූලික කාර්යයන් අතරට අයත් නොවන කාර්යය ලෙස ඔබ තෝරන්නේ.
    (1) සමාජයට අවශ්‍ය සාමාජිකයින් බිහි කිරීම. (2) සමාජීය ඇගයුම් හා හර පද්ධති පවරා දීම.
    (3) සමාජානුයෝජනය (4) වෘත්තීය මාර්ගෝපදේශකත්වය
20. උසස් පෙළ දේශනයකට ආදළව රූප සටහන් වගු රැසක් ඔබේ ග්‍රාහකයාට ඉදිරිපත් කිරීම සඳහා අවම පිරිවැයකින් ඔබට භාවිතා කළ හැකි ප්‍රක්ෂේපණීය උපකරණය වන්නේ,
    (1) වර්ණ විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය. (2) උඩිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
    (3) ශ්වේත පුවරුව. (4) බහුවිධ ප්‍රක්ෂේපණ යන්ත්‍රය.

21. මව විසින් තම කුඩා පුතුට පොතක ඇති රූප පෙන්වමින් කතාන්දරයක් කියයි. මෙම අවස්ථාවට අදාළ නොවන සන්නිවේදන ස්වරූපය වන්නේ,

(1) වාචික සන්නිවේදනය (2) නිර්වාචික සන්නිවේදනය

(3) ශ්‍රව්‍ය සන්නිවේදනය (4) කතාන්දර සන්නිවේදනය

22. විද්‍යුත් නාලිකාවක් ආරම්භ කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ දී ඍජුවම මැදිහත් වන ආයතනයක් වන්නේ,

(1) ජනමාධ්‍ය අමාත්‍යංශය (2) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය

(3) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (4) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

23. සෙලියුලොයිඩ් සේයා පටලය සොයා ගනු ලැබුවේ,

(1) ඩැගියුරේ (2) ජෝන්ලොගි බෙයාර්ඩ්

(3) ජෝර්ජ ඊස්ට්මන් (4) ව්ලැඩිමීර් ස්වෛරිකින්

24. නව මාධ්‍ය උපකරණ වල ප්‍රධාන ලක්‍ෂණයක් වන්නේ,

(1) භූගෝලීය වශයෙන් සීමා වීම.

(2) අභිමත පරිදි සංදේශ තෝරා ගැනීමේ හැකියාව.

(3) පෞද්ගලිකව පරිහරණය කිරීමේ හැකියාව.

(4) ගබඩා කිරීමේ හැකියාව.

25. ශ්‍රී ලංකාවේ ප්‍රථම පුවත්පත වන්නේ,

(1) ලක්මිණි පහන (2) දවස (3) කවට කතිකයා (4) කලම්බු ජර්නල්

26. ආයතනයක් තුළ ඒ ඒ මට්ටම් වල කාර්ය මණ්ඩල අතර ක්‍රියාත්මක වන සන්නිවේදනය හැඳින්විය හැක්කේ,

(1) ඉහළ සන්නිවේදනය (2) පහළ සන්නිවේදනය

(3) හරස් සන්නිවේදනය (4) සිරස් සන්නිවේදනය

27. විධිමත් ගුවන්විදුලි වැඩසටහනක් මුල්වරට ඉදිරිපත් කර ඇත්තේ,

(1) ඇමරිකාවේ ඉලිනොයිස් විශ්ව විද්‍යාලය. (2) රුසියාවේ පීටර්බර්ග් විශ්ව විද්‍යාලය.

(3) ඉන්දියාවේ චෙන්නායි විශ්ව විද්‍යාලය. (4) චීනයේ යුවැංගෝ විශ්ව විද්‍යාලය.

28. පාසලේ වජ්‍ර ජයන්ති සැමරීම සඳහා වාර්තා චිත්‍රපටයක් සැකසීමේ කාර්යය පාසල් මාධ්‍ය සංසදයට පැවරුණි. ඒ සඳහා මාධ්‍ය සංසද කැමරාකරුවන් පහත අවස්ථා පටිගත කරයි.

A - විදුහල්පතිතුමාගේ අදහස් දැක්වීම

B - විදුහල්පති කාර්යාලය

C - පාසල් භූමියේ සමස්ථ දර්ශනය

පාසල හඳුන්වාදීමට ඉහත දර්ශන පෙළගැස්විය යුතු ආකාරය වන්නේ,

(1) AB හා C ලෙසය. (2) AC හා B ලෙසය. (3) BA හා C ලෙසය. (4) CB හා A ලෙසය.

29. අන්තර්පුද්ගල සන්නිවේදනයේ මූලික අවස්ථාවක් ලෙස සැලකිය හැකි වන්නේ,

(1) මානසික පීඩා සමනයයි. (2) මහජන සන්නිවේදනයයි

(3) ද්විපුද්ගල සන්නිවේදනයයි. (4) බලවත් ආවේග පිට කිරීමයි.

30. සමාජ මාධ්‍ය පමණක් අන්තර්ගත වරණය වන්නේ,

(1) ගුගල්, ෆැක්ස්, ෆේස්බුක්, වට්ස්ඇප් (2) රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත, සිනමාව

(3) ෆැක්ස්, ඊමේල්, ඉමෝ, ට්විටර් (4) ෆේස්බුක්, ට්විටර්, වට්සඇප්, ස්කයිප්

31. තොරතුරු රැස් කිරීමේ දී සැලකිය යුතු කරුණක් නොවන්නේ,

(1) තොරතුරු ලබා දෙන දත්ත දායකයා වෙහෙසට පත් නොකළ යුතුය.

(2) ලබා ගන්නා තොරතුරු වල රහස්‍යභාවය ආරක්‍ෂා කළ යුතුය.

(3) සදාචාරයට හානි වන තොරතුරු ලබා ගැනීමෙන් වැලකිය යුතුය.

(4) පෞද්ගලික වාසි අපේක්‍ෂාවෙන් තොරතුරු රැස් කළ යුතුය.

32. මෙරට ගුවන් විදුලි සේවාව සඳහා පිහිට වූ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ පළමු අධ්‍යක්ෂ ධූරය දැරුවේ,

(1) ඩී. එම්. කොළඹගේ මහතා (2) ජෝන් එන් ලැම්ප්සන් මහතා

(3) එඩ්වඩ් හාපර් මහතා (4) හියු ක්ලිෆඩ් මහතා

33. මහජනතාව උනන්දුවක් දක්වන ප්‍රවෘත්ති, වෙළඳ දැන්වීම්, සාහිත්‍ය සම්බන්ධ කරුණු හා අනෙකුත් අංග ඇතුළත්ව දිනපතා හෝ සතිපතා පළ කරන මුද්‍රිත ස්වරූපය පුවත්පත'' බව අර්ථකථන කර ඇත්තේ,

(1) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය (2) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය

(3) බුද්ධිමය දේපල පනත (4) ශ්‍රී ලංකා කර්තෘ සංසදය

34. බොහෝ දුරට ඒකපාර්ශවීය සන්නිවේදනයක් දක්නට ලැබෙන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය තුළය. (2) සමූහ සන්නිවේදනය තුළය.

(3) ජනසන්නිවේදනය තුළය. (4) ද්විපාර්ශවික සන්නිවේදනය තුළය.

35. ගුවන් විදුලි ප්‍රවෘත්ති පිටපත් සම්පාදනයේ දී නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ,

(1) විස්තරාත්මක සංඛ්‍යා දත්ත ඇතුළත් කිරීම.

(2) කරුණු තහවුරු කිරීමට හඬ කොටස් භාවිත කිරීම.

(3) එක් අදහසකට එක් වාක්‍යයක් යොදා ගැනීම.

(4) සමානව උච්චාරණය වන වචන ආසන්නයේ නොයෙදීම.

36. බුද්ධිමය දේපළක් යනු,

(1) ස්පර්ශනීය දේපළකි. (2) පවරන ලද දේපළකි

(3) අස්පර්ශනිය දේපළකි. (4) නිශ්චල දේපළකි.

37. ලිතොග්‍රැෆි මුද්‍රණය ක්‍රමයේ මූලධර්මය වන්නේ,

(1) සිලින්ඩර දෙකක් යොදා ගැනීම. (2) ජලය හා තෙල් මිශ්‍ර නොවීම.

(3) මූලික වර්ණ 04 ක් භාවිතා කිරීම. (4) කඩිනම් හා වර්ණවත් වීම.

38. 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික එක්සත් සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි භාෂණයේ නිදහසට හා ප්‍රකාශනයේ නිදහසට සම්බන්ධ වන ඒවා අතරින් සදොස් ප්‍රකාශය කුමක් ද?

(1) මෙරට පුරවැසි අයිතිවාසිකමකි.

(2) මෙරට සිටින ඕනෑම පුද්ගලයෙකුට ඇති හිමිකමකි.

(3) මානව අයිතිවාසිකමකි.

(4) පුරවැසි මූලික යුතුකමකි.

39. සමාජ ප්‍රතිරූප ගොඩනැංවීම පිළිබඳ පහත කරුණු දක්වා ඇත.

A - ප්‍රතිරූප ගොඩනැංවීම බොහෝවිට සිදුවන්නේ ජනමාධ්‍ය මගිනි.

B - ක්‍රීඩාව, දේශපාලනය, රංගනය වැනි ක්ෂේත්‍රවලට අයිති අය විතරයි ප්‍රතිරූප බවට පත්වන්නේ

C - ජනමාධ්‍ය මගින් ප්‍රතිරූප ගොඩනැංවීම වගේම බිඳ දැමීමත් සිදු වනවා.

ඉහත කරුණු අතරින් සත්‍ය වන්නේ,

(1) A හා C පමණි (2) A හා B පමණි (3) B හා C පමණි (4) A, B, C සියල්ලම

40. නිදොස් ප්‍රකාශය තෝරන්න.

(1) නවකතා, කෙටිකතා, කවිය වැනි නිර්මාණවලට නීති සම්පාදනය වී ඇත.

(2) ශ්‍රී ලංකාවේ අසැබි වෙබ් අඩවි විශාල ප්‍රමාණයකට අවසර ලැබුණි.

(3) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත හඳුන්වා දෙනු ලැබීයි

(4) රජිනගේ ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් වූ මුල් කාලයේ දී පොත් සඳහා පමණක් සීමා විය.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2022

**11 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

වැදගත් :
- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) පවතින සමාජ, ආර්ථික, දේශපාලනික තත්වයන් පිළිබඳ ජනමාධ්‍ය නිරන්තරයෙන් තොරතුරු වාර්තා කරයි.

(i) ජනමාධ්‍ය වර්ගීකරණයේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

(ii) මෙවැනි තොරතුරු වාර්තා කිරීම තුළින් ජනමාධ්‍ය ඉටු කරන ප්‍රධාන සන්නිවේදන කාර්යය කුමක් ද?

(iii) මාධ්‍ය මූලාශ්‍ර හැර මේ පිළිබඳව ඔබට තොරතුරු ලබා ගත හැකි වෙනත් තොරතුරු මූලාශ්‍ර දෙකක් ලියන්න.

(iv) පක්ෂ, විපක්ෂ දේශපාලනඥයින් පුවත්පත් කාටූන් හරහා හාස්‍ය හා උපහාසයට ලක් කරයි. එවැනි නිර්මාණ කිරීමට ජාත්‍යන්තරව හා දේශීය වශයෙන් ඉඩ කඩ ලබා දී ඇති නීතිමය ලේඛන දෙක නම් කරන්න.

(v) කාටූන් චිත්‍ර නිර්මාණයේ දී නිර්මාණකරුවා භාවිත කරන සන්නිවේදන වර්ගය හා ස්වරූපය ලියන්න.

(vi) දේශපාලන මතවාද පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ගුවන්විදුලි මාධ්‍යට භාවිත කළ හැකි වැඩසටහන් ආකෘති දෙකක් ලියන්න.

(vii) පාර්ලිමේන්තුව තුළ සංවාදයක නිරත වූ මන්ත්‍රීවරයෙකු තවත් මන්ත්‍රීවරයෙකුට ප්‍රකාශ කර සිටියේ පුරවැසිභාවයක් නොමැති අයෙකුට එවැනි යෝජනාවක් කිරීමට සදාචාරාත්මක අයිතියක් නොමැති බවයි. පුරවැසියෙකු සතු ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.

(viii) ''ජයග්‍රාහී ආර්ථික මාවතක් කරා'' යනුවෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු වූ සුගත් තිලකරත්න මහතා ග්‍රන්ථයක් රචනා කළේය. ඒ සඳහා ISBN අංකය ලබා ගත යුත්තේ කුමන ආයතනයකින් ද?

(ix) විදුලිබිල වැඩි කිරීම පිළිබඳ ප්‍රවෘත්තියක් ජාතික පුවත්පතක මුල් පිටුවේ පළ කර තිබිණ. එම ප්‍රවෘත්තිය අයත් ප්‍රවෘත්ති ප්‍රභේදය නම් කරන්න.

(x) ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් වූ ජනතාව උද්ඝෝෂණවල යෙදී සිටින ආකාරය දැක්වෙන ඡායාරූපයක් පුවත්පතක පළ කර තිබිණි. ප්‍රවෘත්ති ඡායාරූපයක් ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් ලියන්න.

(ල. 2x10=20)

(02) ලේඛනය හා මුද්‍රණ තාක්ෂණයේ සොයා ගැනීම මුද්‍රිත මාධ්‍යයේ ව්‍යාප්තියට හේතු විය.

(i) මුල්ම කඩදාසිය සොයා ගනු ලැබුයේ කිනම් රටක ද? කවුරුන් විසින් ද? (ල. 01)

(ii) ජීවිතත්ත පත්‍රිකාවක් සකස් කිරීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු හතරක් ලියන්න. (ල. 02)

(iii) සඟරාවක අන්තර්ගත ලක්ෂණ තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) පුවත්පත් මාධ්‍ය ආයතනයක් අභ්‍යන්තර ව්‍යුහය තුළ දක්නට ලැබෙන පහත අංශ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

- ප්‍රවෘත්ති අංශය
- දැන්වීම් අංශය
- සංස්කරණ අංශය
- ඡායාරූප අංශය

(ල. 04)

(03) මාධ්‍ය තරඟකාරීත්වය හරසුන් සංදේශය ලබා දීමට හේතු වී ඇති බව බොහෝ දෙනාගේ අදහසයි.

(i) මාධ්‍ය සංදේශ සම්බන්ධයෙන් ග්‍රාහකයා ක්‍රියා කරන ආකාරය අනුව ප්‍රභේද දෙකකට වෙන්කළ හැකිය. නම් කරන්න. (ල. 01)

(ii) මාධ්‍ය විචාරකයාගේ කාර්යභාරයන් හතරක් ලියන්න. (ල. 02)

(iii) මාධ්‍ය මගින් සංස්කෘතියට, සදාචාරයට නොගැළපෙන සංදේශ ලබා දීමේ දී විචාරශීලී ග්‍රාහකයෙකු ලෙස ප්‍රතිචාර දැක්විය හැකි ආකාර තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) රූපවාහනී මාධ්‍ය ළමයින් සඳහා යහපත් ලෙස හා අයහපත් ලෙස බලපෑම් කර ඇති ආකාර දෙක බැගින් විස්තර කරන්න. (ල. 04)

(04) නිමාලි - පුවත්පත් කර්තෘවරයෙකි.

සමන් - ගුවන් විදුලි නිවේදකයෙකි.

සෞම්‍ය - රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදකයෙකි.

(i) පුවත්පත් ලිපි රචනයේ දී නිමාලි ලේඛන භාෂාව මෙන්ම වාචික භාෂාව ද යොදා ගනියි. භාෂාවක් එසේ වාචික හා ලිඛිත ලෙස පැවතීම කෙසේ හැඳින්වේ ද? (ල. 01)

(ii) ප්‍රවෘත්ති රචනයේ දී නිමාලි අවධානය යොමු කළ යුතු කරුණු 02 ක් ලියන්න. (ල. 02)

(iii) ගුවන්විදුලි නිවේදකයෙකු ලෙස සමන් භාෂාව හැසිරවීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) වැඩසහන් නිෂ්පාදකයෙකු ලෙස සෞම්‍යයට යොදා ගත හැකි රූපවාහිනි වැඩසටහන් ප්‍රභේද 04 ක් විස්තර කරන්න. (ල. 04)

(05) මාධ්‍ය ආචාර ධර්ම, නීතිය, නියාමනය, මාධ්‍ය සංදේශ නිවැරදි දිශාවකට යොමු කරයි.

(i) ශ්‍රී ලංකාව තුළ පුවත්පත් පිළිබඳව පිළිගත් ආචාර් ධර්ම පද්ධති දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) පහත සඳහන් මාධ්‍ය නියාමනයට ලක්කරන නියාමන ආයතන නම් කරන්න.

A පුවත්පත
B ගුවන්විදුලිය
C රූපවාහිනිය
D සිනමාව (ල. 02)

(iii) නවකතා ග්‍රන්ත රචකයෙකු ලෙස ඔබට ලබා ගත හැකි පහත අයිතිවාසිකම් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

* ආර්ථික අයිතිවාසිකම්
* සදාචාරාත්මක අයිතිවාසිකම්
* කර්තෘ භාගය (ල. 03)

(iv) වර්තමානයේ අවම වශයෙන් නියාමනයට ලක්වෙන මාධ්‍ය හතරක් නම් කර එය සමාජයට අයහපත් අයුරින් බලපා ඇති ආකාරය විස්තර කරන්න. (ල. 04)

(06) (i) ආසියාවේ බිහි වූ මුල් ම ගුවන්විදුලි සේවය නම් කරන්න. (ල. 01)

(ii) තොරතුරු වාර්තාකරණයේ දී යොදා ගනු ලබන ඍජු වාර්තාකරණය හා නිර්මාණාත්මක වර්තාකරණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 02)

(iii) ජනමාධ්‍ය කෙරෙහි රජයක් වක්‍රව බලපෑම් කරන ආකාර තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(iv) සිනමාව හා රූපවාහිනි මාධ්‍ය තුළ නිශ්චල ඡායාරූප භාවිතා කරන අවස්ථා හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

(07) නුවන්දි විධායක නිලධාරිනියකි. ඇය තම රාජකාරී කටයුතු කාර්යක්ෂම කර ගැනීම සඳහා විවිධ මාධ්‍ය තාක්ෂණික උපකරණ භාවිතා කරයි.

(i) නුවන්දි විධායක නිලධාරිනියක ලෙස හඳුනා ගැනීම උපකාරීවන නිර්වාචික සාධක දෙකක් ලියන්න. (ල. 01)

(ii) ඇයට ද්වි පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගත හැකි මාධ්‍ය තාක්ෂණික උපකරණ හතරක් ලියන්න. (ල. 02)

(iii) නුවන්දි තම ආයතනයේ අනාගත ඉලක්ක පිළිබඳ ව සේවක සේවිකාවන් දැනුවත් කිරීම සඳහා දේශනයක් පැවැත්වීමට තීරණය කරන ලදී. එම දේශනය ඵලදායී කර ගැනීමට ඇයට යොදා ගත හැකි උපක්‍රම තුනක් විස්තර කරන්න. (ල. 03)

(iv) බොහෝ කාර්යාලීය ලිපි ගනුදෙනු සඳහා ඇය විද්‍යුත් තැපැල භාවිත කරන ලදී. විද්‍යුත් තැපැල භාවිතා කිරීමේ වාසි හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **අවසාන වාර පරීක්ෂණය 2022**

**11 ශ්‍රේණිය** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය 1/2**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(4) | 4 -(1) | 5 -(4) | 6 -(3) | 7 -(3) | 8 -(2) | 9 -(2) | 10 -(3) |
| 11-(1) | 12 -(2) | 13 -(4) | 14 -(2) | 15 -(3) | 16 -(2) | 17 -(4) | 18 -(4) | 19 -(4) | 20 -(2) |
| 21-(4) | 22 -(3) | 23 -(3) | 24 -(3) | 25 -(4) | 26 -(3) | 27 -(2) | 28 -(4) | 29 -(3) | 30 -(4) |
| 31-(4) | 32 -(2) | 33 -(2) | 34 -(3) | 35 -(1) | 36 -(3) | 37 -(2) | 38 -(4) | 39 -(1) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01. (i) මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය
(ii) තොරතුරු සැපයීම (තොරතුරු සම්පාදනය)
(iii) ලිඛිත මූලාශ්‍ර / පුද්ගල මූලාශ්‍ර / ආයතනික මූලාශ
(iv) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය / ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(v) අන්තර්වර්තී / අවාචික (නිර්වාචික)
(vi) කතා / සංවාද / සම්මුඛ සාකච්ඡා / ප්‍රවෘත්ති
(vii) ඡන්ද අයිතිය පැවතීම / නිශ්චිත දේශ සීමාවක නිශ්චිත භූමියක ජීවත් වීම.
(viii) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයෙන්
(ix) දෘඪ පුවත්
(x) අදාළ සියලු විස්තර ඇතුළත් වී තිබීම / රාමුව තුළ ඡායාරූපික වස්තූන් මානව සංවිධානය කර තිබීම / අනවශ්‍ය දෑ ඇතුළත්ව නොවීම / උචිත කැමරාකෝණ භාවිතය ආදිය (ල. 2 x 10 = ල. 20)

(02) (i) චීනය / ට්සායි ලූන් (ල. 01)
(ii) $A_4$ කඩදාසි භාවිතය / පරිගණ අකුරු භාවිතය / ආකර්ශණීය බව / මාතෘකා තද අකුරින් යෙදීම / වර්ණ අකුරු හෝ කඩදාසි යොදා නොගැනීම ආදිය. (ල. 1 x 2 = ල. 02)
(iii) වාරිකව ප්‍රකාශයට පත් කිරීම / බඳින ලද පිටු සහිත තොරතුරු එකතුවක් වීම / විෂයය, ප්‍රමාණය, ඉලක්ක ග්‍රාහකයා අනුව සඟරා වර්ග කළ හැකි වීම / සඟරාවක අවසාන වගකීම දරන්නා සංස්කාරකයා වීම ආදිය. (ල. 1 x 3 = ල. 03)
(iv) ප්‍රවෘත්ති අංශය, දැන්වීම් අංශය, සංස්කරණ අංශය, ඡායාරූප අංශය විස්තර කර තිබිය යුතුය. (ල. 1 x 4 = ල. 04)

(03) (i) සක්‍රීය ග්‍රාහකයා හා අක්‍රීය ග්‍රාහකයා (ල. 01)
(ii) මාධ්‍ය සංදේශවල යටි අරුත් පෙන්වා දීම / ග්‍රාහකයා මාධ්‍ය සංදේශවලට හසු වීමෙන් වැලක්වීම / මාධ්‍ය සංදේශ නිවැරදිව පරිහරණය කිරීමට ග්‍රහකයාට මඟ පෙන්වීම / යහපත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට උරදීම ආදිය (ල. 1 x 2 = ල. 02)
(iii) තැපැල් මඟින් / පුවත්පත් ලිපි මගින් ප්‍රතිචාර දැක්වීම / දුරකථන මගින් / මාධ්‍ය පාගමන් යාම ආදිය මගින් / අත්පත්‍රිකා බෙදා හැරීම මගින් (ල. 1 x 3 = ල. 03)
(iv) යහපත් බලපෑම්
- ★ සෞන්දර්යාත්මක හැඟීම් වර්ධනය කිරීම.
- ★ විවිධ සිරිත් විරිත් පුරුදු වීම.
- ★ එක් දෙයක් කෙරෙහි අවධානය යොමු කිරීමට පුහුණු වීම ආදිය

අයහපත් බලපෑම්
- ★ වැරදි පරිභෝජන රටාව
- ★ ප්‍රචණ්ඩකාරී මනසක් නිර්මාණය වීම.
- ★ නොගැළපෙන චර්යාවන්ට යොමු වීම ආදිය. (ල. 1 x 4 = ල. 04)

(04) (i) භාෂා ද්විරූපතාවය (ල. 01)
(ii) යටිකුරු පිරමීඩ සංකල්පය යොදා ගැනීම / සරල බස්වහරක් යොදා ගැනීම / වචන වාක්‍ය නිවැරදිව වෙන් කර දැක්වීම / නිර්මාණශීලී ශීර්ෂ පාඨ යෙදීම / වාක්‍යකරණ නිවැරදිව භාවිත කිරීම ආදිය / අතීතය සඳහන් කරමින් පෙළ ආරම්භ නොකිරීම (ල. 1 x 2 = ල. 02)
(iii) සරල භාෂාවක් යොදා ගැනීම / පරිකල්පනීය භාෂාවක් යොදා ගැනීම / අර්ථය පැහැදිලිව ප්‍රකාශය කිරීම / කෙටි වාක්‍ය යොදා ගැනීමට ආදිය (ල. 1 x 3 = ල. 03)

(iv) ප්‍රවෘත්ති වැඩසටහන් / සඟරාමය වැඩසටහන් / වාර්තා වැඩසටහන් / සංගීතමය වැඩසටහන් / නාට්‍යමය වැඩසටහන් ආදිය (ල. 1 x 4 = ල. 04)

(05) (i) ශ්‍රී ලංකා ප්‍රවෘත්ති මණ්ඩලයේ ආචාර ධර්ම මාලාව / නිදහස් මාධ්‍ය සංසදයේ ආචාර ධර්ම මාලාව / ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව / ජනමාධ්‍ය වේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ ආචාර (ල. 01)

(ii) පුවත්පත - ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
ගුවන් විදුලිය - විදුලි සංදේශ නියාමන කොමිසම
රූපවාහිනිය - විදුලි සංදේශ නියාමන කොමිසම
සිනමාව - රූගුම් පාලක මණ්ඩලය (ල. 02)

(iii) <u>ආර්ථික අයිතිවාසිකම්</u>
නිර්මාණකරුවෙකුට තම කෘතිය විකිණීමෙන් හෝ කර්තෘගේ අයිතිය විකුණා දැමීමෙන් හෝ බදු දීමෙන් හෝ කුලියට දීමෙන් පසු මූල්‍යමය වශයෙන් ලබා ගැනීමට ඇති අයිතිවාසිකමයි.
<u>සදාචාරාත්මක අයිතිවාදිකම්</u> -
කර්තෘගේ අනන්‍යතාව පිළිබඳ පවතින අයිතිවාසිකමයි. ආර්ථික අයිතිවාසිකම් අන්‍යයන්ට පැවරිය හැකි නමුත් සදාචාරාත්මක අයිවාසිකම් පැවරිය නොහැක.
<u>කර්තෘ භාගය</u>
කර්තෘ කෙනෙකු විසින් තම කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීම සඳහා වෙනත් අයෙකුට පැවරීමෙන් පසු එසේ ප්‍රතිනිෂ්පාදනය කරන පිටපත් ප්‍රමාණය මත හා අලෙවිකරණ මිල මත ලැබෙන මූල්‍යමය ප්‍රතිලාභයයි.
(ල. 1 x 3 = 03)

(iv) කවිය, නවකතාව, කෙටිකතාව, සමාජ මාධ්‍යය මෙයින් සංස්කෘතියට සිදු වී ඇති හානිය පිළිබඳ විස්තර කර තිබිය යුතුය. (ල. 04)

(06) (i) ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවය (ල. 01)

(ii) ඍජු වාර්තාකරණය -අවශ්‍ය තොරතුරු පමණක් යොදා ගනිමින් සරලව සංක්ෂිප්තව වාර්තා කිරීම
උදා - ප්‍රවෘත්ති වාර්තාකරණය
නිර්මාණාත්මක වාර්තාකරණය - නිර්මාණශීලී භාෂාවක් භාවිත කරමින් විස්තරාත්මකව තොරතුරු ඇතුළත් කරමින් වාර්තා කිරීමයි.
උදා - විශේෂාංග ලිපි වාර්තාකරණය (ල. 1 x 2 = 02)

(iii) ආචාර ධර්ම පද්ධති හඳුන්වා දීම / මාධ්‍යවේදීන් සඳහා විශේෂ පහසුකම් ලබා දීම / ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල මගින් ජනමාධ්‍යයට එරෙහි මහජන පැමිණිලි භාරගැනීම හා විභාග කිරීම හා තීන්දු ලබා දීම / මාධ්‍යවේදීන් පැහැරගෙන යාම ඝාතනය කිරීම ආදිය (ල. 1 x 3 = 03)

(iv) පසුතල දර්ශනවල අඛණ්ඩතාවය ආරක්ෂා කර ගැනීම සඳහා / පසුබිම් දර්ශන තල තෝරා ගැනීම සඳහා / නළු නිළියන්ගේ වේෂ නිරූපණයේ අඛණ්ඩතාවය රැක ගැනීමට / කලා අධ්‍යක්ෂණය සඳහා / ප්‍රචාරක කටයුතු සඳහා / අධ්‍යයන කටයුතු සඳහා /මුද්‍රිත මාධ්‍යයේ කෙරෙන වෙළඳ දැන්වීම, විශේෂාංග ලිපි ආදිය සඳහා.
(ල. 1 x 4 = 04)

(07) (i) ඇඳුම් පැළඳුම් / සේවක සේවිකාවන් සමග සිටින දුර ප්‍රමාණය / ඇයගේ කාර්යාලීය පරිසරය ආදිය (ල. 01)

(ii) දුරකථනය / විද්‍යුත් තැපෑල / ෆැකස් පණිවිඩ / අන්තර්ජාල දුරකතන / සමාජ ජාලා (ල. 02)

(iii) ප්‍රදීපාගාර සංකල්පය භාවිත කිරීම / මාධ්‍ය තාක්ෂණික උපකරණ භාවිත කිරීම / දක්ෂ ලෙස කථන නිපුණතාවය යොදා ගැනීම / ආකර්ෂණීය ලෙස සන්නිවේදන කාර්යයේ නිරත වීම ආදිය. (ල. 1 x 3 = 03)

(iv) කෙටි කාලයක් තුළ ලොව ඕනෑම තැනකට පණිවිඩයක් යැවිය හැකි වීම / ඡායා රූප / සුබපැතුම්පත් වීඩියෝ ආදිය යැවිය හැකි වීම / කඩදාසි , මුද්දර, ලිපි, කවර ආදිය අවශ්‍ය නොවීම / ලැබෙන ලිපි අනුපිළිවෙලින් ගබඩාකර තැබිය හැකි වීම / සුරක්ෂිත බව / යවනු ලබන ලේඛනවල පිටපත් ගබඩා කර තබා ගත හැකි වීම.
(ල. 1 x 4 = 04)